මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, අංක.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :PRE/2024/31 2024.08.14

## ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම - 2024
## නාමයෝජනා භාර ගැනීමේ වැඩ පිළිවෙල - 2024.08.15

2024.09.21 වන දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීමේ දී තරඟ කිරීම සඳහා 2024.08.14 දින මධ්‍යාහ්න 12.00 දක්වා ඇප මුදල් තැන්පත් කරන ලද සියලුම අපේක්ෂකයන් සඳහා 2024.08.15 වන දින නාමයෝජනා භාර දීම සඳහා මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයට පැමිණීමට අදාළව සහ නාමයෝජනා භාර ගැනීමේ දී ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිළිවෙල මතු දක්වා ඇත.

**1. නාමයෝජනා භාර ගැනීම**

නාමයෝජනා භාර ගැනීම 2024.08.15 වන දින පෙරවරු 9.00 සිට 11.00 දක්වා අතර කාලය තුළ මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන් විසින් රාජගිරියේ පිහිටි මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ ශ්‍රවණාගාරයේ දී සිදු කෙරේ.

**2. නාමයෝජනා පත්‍රවලට විරෝධය දැක්වීම**

යම් ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයකු විසින් හෝ ඒ ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයාගේ නාම යෝජනා පත්‍රය අත්සන් කළ තැනැත්තා විසින් හෝ අපේක්ෂකයකුගේ/ අපේක්ෂකයන්ගේ නාමයෝජනා පත්‍රවලට නාමයෝජනා භාර ගැනීමේ දින පෙරවරු 9.00 සිට 11.30 දක්වා ලිඛිතව විරෝධතා දැක්විය හැකි ය.

**3. 2024.08.15 වන දින මැතිවරණ කොමිෂන් සභා කාර්යාල පරිශ්‍රයට ඇතුළුවීමට අවසර ඇති අය**

i. අපේක්ෂකයන්
ii. අපේක්ෂකයන්ගේ නාමයෝජනා පත්‍ර අත්සන් කර ඇති අය
iii. එක් අපේක්ෂකයෙක් වෙනුවෙන් අපේක්ෂකයා විසින් තෝරාගත් වෙනත් එක් අයකු
iv. එක් අපේක්ෂකයෙක් වෙනුවෙන් අමුත්තන් 03 දෙනෙකු බැගින්
v. මැතිවරණ කොමිෂන් සභාවේ දැන්වීම මත ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරය ලත් මාධ්‍ය ආයතන වෙනුවෙන් ප්‍රවෘත්ති ආවරණය කිරීම සඳහා පැමිණෙන මාධ්‍ය ආයතනවල අවසරලත් නියෝජිතයන්
vi. මැතිවරණ කොමිෂන් සභාවේ අවසර ලත් කාර්යය මණ්ඩලය සහ සහාය සේවා සපයනු ලබන ආයතනවල නියෝජිතයන්/ සේවකයන්
vii. මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ ආරක්ෂක නිලධාරීන් සහ සනීපාරක්ෂක සේවා කාර්ය මණ්ඩලය
viii. අපේක්ෂකයන්ගේ පෞද්ගලික ආරක්ෂාව සලසන ආරක්ෂක අංශ විසින් අවසර ලබා දී ඇති රජයේ ආරක්ෂක නිලධාරීන් (PSO)

**4. නාමයෝජනා භාරගනු ලබන ශාලාවට ඇතුළුවීමට අවසර ඇති අය**

i. අපේක්ෂකයන්
ii. අපේක්ෂකයන්ගේ නාමයෝජනා පත්‍ර අත්සන් කර ඇති අය
iii. එක් අපේක්ෂකයෙක් වෙනුවෙන් වෙනත් එක් අයෙක්
iv. මැතිවරණ කොමිෂන් සභාවේ අවසර ලත් කාර්යය මණ්ඩලය
v. අවසරලත් මාධ්‍යය ආයතනයන්හි ප්‍රවෘත්ති ආවරණය කිරීම සඳහා නාමයෝජනා භාර ගන්නා ශාලාවට ඇතුළුවීමට අවසර දී ඇති කැමරා ශිල්පීන්, කාර්මික නිලධාරීන් සහ සහායකයින්

5. **අපේක්ෂකයන්, නාමයෝජනා පත්‍රය අත්සන් කර ඇති අය, අපේක්ෂකයා වෙනුවෙන් පැමිණෙන අනිත් පුද්ගලයා සහ අමුත්තන් පැමිණෙන වාහන**

i. අපේක්ෂකයාගේ වාහනයට පමණක් (**A අක්ෂරය දරණ වාහන අවසර පත්‍රය ප්‍රදර්ශනය කළ යුතු ය.**) මැතිවරණ කොමිෂන් සභා කාර්යාල භූමියට ඇතුල්වීමෙන් පසු එහි ගාල් කිරීම/ අන්‍ය අයුරකින් ගාල් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

ii. නාමයෝජනා පත්‍රය අත්සන් කර ඇති අය සහ එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් නාමයෝජනා ස්ථානයට ඇතුළුවීමට අවසර ඇති අනිත් පුද්ගලයාගේ වාහන (**"B" අක්ෂරය දරන වාහන අවසර පත්‍රය ප්‍රදර්ශනය කළ යුතු ය.**) සරණ මාවතට ඇතුළු කොට අදාළ අය එහි බැස්සවීමෙන් පසු එම වාහන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා රථගාලේ, රාජගිරිය කොටා පාරේ පිහිටි හෘදය දේවස්ථාන භූමියේ සහ රාජගිරිය ජනපය සිටි රථගාලේ ගාල් කර තැබීමට පහසුකම් සලසනු ලැබේ.

iii. අපේක්ෂකයන්ගේ අමුත්තන් පැමිණෙන වාහන (**"C" අක්ෂරය දරන වාහන**) පරණ කෝට්ටේ පාර දෙසින් හෝ පාර්ලිමේන්තු පාර දෙසින් පැමිණ සරණ මාවතට ඇතුළුවීමට හැකි අවසන් කපොල්ල දක්වා පැමිණ අමුත්තන් එම ස්ථානයේ බැස්සවීමෙන් පසු එම වාහන ද ඉහත ii හි සඳහන් ස්ථානවලම ගාල් කළ යුතු ය.

iv. ඉහත ii හා iii හි පරිදි පැමිණෙන අයට එකී මුරකපොලුහි සිට මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය දක්වා පැමිණීමට කොමිෂන් සභාව ප්‍රවාහන පහසුකම් (Shuttle Services) සලසනු ඇත.

6. **(1) මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයට පිවිසෙන රාජගිරියේ සරණ මාවතෙහි පිහිටා ඇති ආයතන**

2024.08.15 දින පස්වරු 2.00 දක්වා වාහනවලට සහ පදිකයන්ට ඇතුළු වීමට නොහැකි වන සේ රාජගිරිය සරණ මාවත පොලීසිය විසින් වසා තබන බව එහි පිහිටා ඇති සියලුම ආයතනවලින් සේවා ලබා ගන්නා සහ ඒවායේ කාර්ය මණ්ඩල වෙත දන්වා සිටිනු ලැබේ.

**(2) රාජගිරියේ නාගරික ප්‍රදේශයේ පිහිටි අනිකුත් රජයේ සහ පෞද්ගලික ආයතනවල කාර්යය මණ්ඩලය, එම ස්ථානවලට පැමිණෙන අය සහ වාහන**

ඉහත 6 හි සඳහන් ආයතනවල සේවය කරනු ලබන අයට සහ එම ආයතනවලට පැමිණෙන වාහනවලට සරණ මාවතෙන් ප්‍රවේශ වීමට ඇති මාර්ගයෙන් ගමන් කිරීමට මෙදින පෙ.ව. 06.00 සිට පස්වරු 02.00 පමණ දක්වා ඉඩ නොදෙන බැවින් අදාළ ගමනා ගමන පහසුකම් සලසා ගත යුත්තේ රාජගිරිය බස් නැවතුම් පොළ ආසන්නයෙන් ඇති ප්‍රවේශ මාර්ගය ඔස්සේ ය.

7. **පොලිසිය විසින් මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය අවට මහා මාර්ගවල වාහන ගමනාගමනය පරිපාලනය කිරීම සඳහා 2024.08.15 වන දින යොදා ඇති වැඩ පිළිවෙල**

i. නාමයෝජනා පත්‍ර භාර දීම සඳහා පැමිණෙන අපේක්ෂකයන්ගේ වාහනවලට ආයුර්වේද හන්දිය පසුකොට පරණ කෝට්ටේ පාර ඔස්සේ හෝ පාර්ලිමේන්තු මාර්ගය ඔස්සේ පැමිණ සරණ මාවතට ඇතුළු වී මැතිවරණ කොමිෂන් සභා කාර්යාල භූමියට ඇතුළුවීමට ඉඩ දෙනු ඇත.

ii. නාමයෝජනා භාරදීම සඳහා පැමිණි අපේක්ෂකයන් ඒ සඳහා පැමිණි මාර්ගයේම නාමයෝජනා කටයුතුවලින් පසුව ආපසු ගමන් කළ යුතු ය.

iii. මෙදින ක්‍රියාත්මක කරනු ලබන විශේෂ රථවාහන සැලැස්ම පිළිබඳව පොලිසිය විසින් මහජනයා දැනුවත් කරනු ඇත.

8. **මාධ්‍යය ආයතනවලින් පැමිණෙන නිලධාරීන්, නියෝජිතයන් සහ කැමරා උපකරණ ආදිය පරීක්ෂා කොට මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය දක්වා ප්‍රවාහනය කිරීම.**

මෙම කටයුතු මැතිවරණ කොමිෂන් සභාවත් අදාළ ආරක්ෂක අංශවලත් උපදෙස් පරිදි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලබන අතර ඒ පිළිබඳව මාධ්‍යය ආයතන දැනුවත් කිරීම එම දෙපාර්තමේන්තුව මගින් සිදුකෙරේ.

ආර්.එම්.ඒ.එල්.රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)